දුරකථන / தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister — 2784832, 2784807, 2785617
ලේකම් / செயலாளர் / Secretary — 2784812
කාර්යාලය / அலுவலகம் / Office — 2785141-50, Fax: 2784846
ඊමේල් / ஈ-மெயில் / E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education
'ඉසුරුපාය' ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
බත්තරමුල්ල
'இசுருபாயா' ஸ்ரீ ஜயவர்தனபுர கோட்டை
பத்தரமுல்ல
"Isurupaya", Sri Jayawardhanapura Kotte
Battaramulla.
පාසල් කටයුතු හා පෞද්ගලික පාසල් ශාඛාව

මගේ අංකය / எமது இல. / My No. — ED/01/12/07/04/01-2013

ඔබේ අංකය / உமது இல. / Your No. — ..............................

දිනය / திகதி / Date — 2013.04. 11

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නි.අ.අ/ස.අ.අ.වරුන්,
සියලු ම විදුහල්පතිවරුන්,

## ගුරු හා විදුහල්පති ඇගයීම

ඵලදායී ගුණාත්මක අධ්‍යාපනයක් උදෙසා මහඟු මෙහෙවරක යෙදී සිටින ගුරු හා විදුහල්පතිවරුන් අගයනු වස් මෙවර ද ලෝක ගුරු දිනයට සමගාමී ව ජාතික මට්ටමින් ගුරු හා විදුහල්පති ඇගයුම් උළෙලක් 2013 ඔක්තෝම්බර් මාසයේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

එයට සමගාමී ව සුදුසුකම් සහිත විදුහල්පතිවරුන් හා ගුරුවරුන් තෝරා ගැනීමේ නිර්ණායක ඇතුළත් 2011/23 දරන චක්‍රලේඛය හා එයට අදාළ සංශෝධන ඇතුළත් චක්‍රලේඛ උපදෙස් ලිපිය මේ සමඟ ඔබ වෙත යොමු කරමි.

එම උපදෙස් නියමිත පරිදි අධ්‍යයනය කර, එහි දක්වා ඇති කාල රාමුව තුළ සුදුස්සන් තෝරා නියමිත නාමලේඛන අදාළ ආයතන වෙත ලබාදීමට කටයුතු කරන ලෙස කාරුණික ව දන්වමි.

අදාළ චක්‍රලේඛයේ කරුණු මැනවින් අධ්‍යයනය කර නිසි ආකාරව සම්මානලාභීන් තෝරා ගැනීමට කටයුතු කරන ලෙස වැඩි දුරටත් දන්වමි. මේ අනුව 2011.06.24 දිනැති අංක 2011/23 දරන චක්‍රලේඛයේ මෙහි දක්වා ඇති වගන්ති පමණක් සංශෝධනය කර ඇති අතර සෙසු වගන්ති නො වෙනස් ව පවතින බව අවධාරණය කරමි.

2011/23 දරන චක්‍රලේඛය සම්බන්ධයෙන් පහත සඳහන් සංශෝධනයන් සිදු කරන අතර එම සංශෝධන අනුව සම්මානලාභීන් තෝරා ගැනීමට කටයුතු කරන ලෙස දන්වමි.

- විදුහලක සේවය කරනු ලබන ගුරුවරුන් අතරින් සම්මාන ලැබීමට සුදුසු, සුදුසුකම් සහිත ගුරුවරුන්ගේ අයදුම්පත් පමණක් මේ සඳහා ඉදිරිපත් කරවීමට සෑම විදුහල්පතිවරයෙකු ම වගබලා ගත යුතු වේ.

5.2 අනියම් හා වෛද්‍ය නිවාඩු මුළු දින ගණන 60 ක් හෝ ඊට අඩු විය යුතු ය.

7.2 සුදුසුකම්ලත් ගුරුවරු තම අභිමතය පරිදි ඇමුණුම් අංක 01 හි දැක්වෙන අයදුම් පත්‍රය සම්පූර්ණ කර 2013.05.20 වන දිනට පෙර විදුහල්පතිට භාර දිය යුතු ය. ඉන් පසු ඇමුණුම් අංක 02හි දැක්වෙන ඇගයීම් පත්‍රිකා අනුව ඇගයීම සිදු කර, පාසල් මට්ටමින් තෝරා ගත් ගුරුවරුන්ගේ අයදුම්පත් හා ඇගයීම් පත්‍රිකා, අවසන් ඇගයීම කලාපයෙන් සිදු කරනු ලබන, පාසලක් නම් කොට්ඨාස භාර නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට හෝ සහකාර අධ්‍යාපන

අධ්‍යක්ෂවරයාට ද, අවසාන ඇගයීම දිස්ත්‍රික්කයෙන් කරන පාසලක් නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට ද 2013.06.03 වන දිනට පෙර භාරදිය යුතු වේ.

8.5 එම ගුරුවරු 45 දෙනා අතරින් ඔවුන් ලබා ගත් ලකුණු අනුව එක් පාසල් කාණ්ඩයකින් එක් අංශයකට එක් ගුරුවරයකු බැගින් පාසල් කාණ්ඩ 05 ම සඳහා අංශ 3න් ගුරුවරුන් 15ක්, කොට්ඨාස මට්ටමින් තෝරා, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතු ය. මෙසේ තෝරා ගත් ගුරුවරු 15 දෙනාගේ විස්තර ඇතුළත් නාම ලේඛනය (ඇමුණුම් අංක 05 ට අනුව) ඇගයීම් පත්‍රිකා හා අයදුම්පත්‍රිකා කවරක බහා, මුද්‍රා තබා කොට්ඨාසයේ නම පැහැදිලි ව සටහන් කර 2013.07.01 වන දින හෝ ඊට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට භාර දිය යුතු ය.

9.5 ඒ අනුව දිවයිනේ සෑම කලාපයකින් ම ගුරුවරු උපරිම වශයෙන් 15 ක් බැගින් තෝරා ඇමුණුම් අංක 05 දරන ආකෘතිය සම්පූර්ණ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට 2013.07.22 වන දිනට පෙර යොමු කළ යුතු ය. ගුරු අයදුම්පත් හා ඇගයීම් පත්‍රිකා ඇතුළු ලිපි ලේඛන සියල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් කිරීම සඳහා සුරක්ෂිත ව තබා ගත යුතු අතර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ලබා දුන් නාම ලේඛන, නිර්දේශ කර අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) වෙත 2013.08.05 වන දිනට පෙර එවිය යුතු ය.

10.5 දිස්ත්‍රික්කයකින් උපරිම වශයෙන් ගුරුවරු 15 ක් බැගින් තෝරා ඇමුණුම් අංක 05 දරන ආකෘතිය අනුව සකස් කරන නාම ලේඛනය දිස්ත්‍රික් ඇගයීම් කමිටුවේ සභාපති පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2013.07.22 වන දිනට පෙර යොමු කළ යුතු ය. මේ සමඟ ගුරු අයදුම්පත් හා ගුරු ඇගයීම් පත්‍රිකා සියල්ල ඇතුළු ලිපි ලේඛන ද ඉදිරිපත් කළ යුතු ය. අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් කිරීම සඳහා මෙම ලේඛන, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සුරක්ෂිත ව තබා ගත යුතු ය.

10.6 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කලාප මට්ටමින් තෝරා ගත් ගුරු ප්‍රණාමලාභීන්ගේ ලේඛනය සමඟ දිස්ත්‍රික් අනුව තෝරා ගත් ගුරු ප්‍රණාමලාභීන්ගේ නාම ලේඛනය නිර්දේශ කර අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) වෙත 2013.08.05 වන දිනට පෙර එවිය යුතු ය.

12.2 ඉහත සඳහන් සුදුසුකම් සපුරා ඇති රජයේ පාසල්වල විදුහල්පතිවරු විසින් ඇමුණුම් අංක 03හි දැක්වෙන ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් සම්පූර්ණ කර 2013.05.10 වන දිනට පෙර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවිය යුතු ය.

14.3 පාසල්වලට ගොස් විදුහල්පතිවරු 15දෙනා ඇගයීමට ලක් කළ පසු ඔවුන් ලබා ගත් ලකුණුවල ප්‍රමුඛතාව අනුව විදුහල්පතිවරු 10ක් තෝරා ඔවුන්ගේ විස්තර ඇතුළත් නාම ලේඛනය ඇමුණුම් අංක 05ට අනුව කලාප තේරීම් කමිටුවට 2013.06.24 වන දිනට පෙර ඉදිරිපත් කළ යුතු ය. මේ සමඟ අදාළ අයදුම්පත්, ඇගයීම් පත්‍රිකා හා අදාළ ලිපි ලේඛන සියල්ල ද කලාප තේරීම් කමිටුවට භාර දිය යුතු ය.

14.8 ඒ අනුව දිවයිනේ සෑම කලාපයකින් ම උපරිම වශයෙන් විදුහල්පතිවරු 05ක් බැගින් තෝරා ඇමුණුම් අංක 05 දරන ආකෘතියට අනුව සම්පූර්ණ කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට 2013.07.22 වන දිනට පෙර යොමු කළ යුතු ය. විදුහල්පති අයදුම්පත් හා ඇගයීම් පත්‍රිකා ඇතුළු ලිපි ලේඛන සියල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අවශ්‍ය අවස්ථාවල දී ඉදිරිපත් කිරීම සඳහා සුරක්ෂිත ව තබා ගත යුතු ය.

14.9 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ලබා දුන් නාම ලේඛන නිර්දේශ කර, අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) වෙත 2013.08.05 වන දිනට පෙර එවිය යුතු ය.

(ඇමුණුම් අංක 05හි ඇගයුම්ලාභියාගේ නම සඳහන් කිරීමේ දී ජාතික හැඳුනුම් පතෙහි අංකය ද පාසලේ නම හා ලිපිනය ද, විශේෂ සටහන් තුළ ඇගයුම්ලාභියාගේ දුරකථන අංකය ද සඳහන් කරන්න.)

මීට අතිරේකව පහත සඳහන් ඡේදය ද ඇතුළත් කර ගත යුතු ය.

15.0 **සුවිශේෂී දක්ෂතා ඇති ගුරුවරුන් හා විදුහල්පතිවරුන් තෝරා ගැනීම.**

අධ්‍යාපන පද්ධතිය තුළ දැනුමෙන් කුසලතාවයෙන් පරිපූර්ණ, පද්ධතියට නිර්මාණශීලී දායකත්වයක් ලබාදෙමින්, මනා පෞරුෂත්වයකින් හෙබි දරු පරපුරක් බිහිකිරීමට, උදාරතර මෙහෙවරක නිරත වූ ද, සාමාන්‍ය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නව නිම් වළලු පුළුල් කරමින්, නිර්මාණශීලී, ගවේෂණශීලී කර්තව්‍යයන්හි නිරත වූ ද ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ සුවිශේෂී දක්ෂතා දක්වමින් අධ්‍යාපන පද්ධතියට කීර්තියක් ලබා දුන් ගුරුවරුන් හා විදුහල්පතිවරුන් අතරින් තෝරා ගත් පිරිසක් ජාතික මට්ටමින් ඇගයීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත.

15.1 මෙම සුවිශේෂී දක්ෂතා ඇති ගුරුවරුන් හා විදුහල්පතිවරුන් තෝරා ගැනීම සඳහා විශේෂ සුදුසුකම් හෝ නිර්ණායක ලබා නො දෙන අතර මෙම තෝරා ගැනීම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් සිදු කළ යුතු ය.

15.2 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා අදාළ අධ්‍යාපන නිලධාරින්ගේ අදහස් විමසීමෙන් පසු ව එක් පළාතකින් ඉහත සඳහන් පරිදි සුවිශේෂී දක්ෂතා දැක් වූ විදුහල්පතිවරුන්, ගුරුවරුන් 06 දෙනෙකු තෝරා ගත යුතු ය. මෙලෙසින් පළාත් 09 න් ම සුවිශේෂී දක්ෂතා දැක්වූවන් 54 දෙනෙකු තෝරා අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) වෙත 2013.07.01 වන දිනට පෙර එවිය යුතු ය.

15.3 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් තෝරා ගත් ඇගයුම්ලාභීන් 06 දෙනාගේ දක්ෂතාවන් පිළිබඳ තොරතුරු ඇතුළත් වාර්තාවක් අදාළ දක්ෂතාවන් සනාථ කිරීමට අවශ්‍ය සාධක සමඟ ඉදිරිපත් කළ යුතු ය.

15.4 අධ්‍යාපන ලේකම් විසින් පත් කරනු ලබන පස් දෙනෙකුගෙන් සමන්විත කමිටුව විසින් අවසාන ඇගයුම්ලාභීන් තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

15.5 ඒ අනුව ජාතික මට්ටමේ ඇගයීම සඳහා අවසානයේ ගුරුවරුන් හා විදුහල්පතිවරුන් අතරින් 25 දෙනෙකු තෝරා ගත යුතු ය.

ඉහත චක්‍රලේඛ ලිපියේ දක්වා ඇති පරිදි ගුරුවරුන් හා විදුහල්පතිවරුන් ඇගයීමට ලක් කොට සුවිශේෂී දක්ෂතා සහිත විශිෂ්ට ගුරුවරුන් හා විදුහල්පතිවරුන් තෝරා ගැනීම සිදුකරනු ඇතැයි අපේක්ෂා කරමි.

එස්.යූ.විජේරත්න
අතිරේක ලේකම්
(සැලසුම් හා කාර්ය සාධන සමාලෝචන)
වැ/බ ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

1. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති.
2. ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්.
3. විභාග කොමසාරිස් ජනරාල්.
4. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්.
5. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම මාණ්ඩලික නිලධාරීන්.
6. අධ්‍යාපන අමාත්‍යාංශයේ සියලු ම ශාඛා ප්‍රධානීන්.